# තරණය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය 2024 - හතර වන කලාපය

## පළාත් ග්‍රාමසංවර්ධන සමිති ශක්තිමත් කිරීම උදෙසා ..............

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය හා මධ්‍යම පළාත් ග්‍රාමසංවර්ධන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ වෙමින් පළාත් ග්‍රාමසංවර්ධන සමිති බලධාරී ක්‍රියාකාරින් 60 දෙනකු සහභාගිත්වයෙන් දෙදින පුහුණු වැඩමුළුව 2024.10.03 දින හා 2024.10.04 වන දින පවත්වන ලදි. මේ සඳහා සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂණ නිලධාරී ප්‍රේමානි දාස්වත්ත මහත්මිය හා පුහුණු හා පර්යේෂණ නිලධාරී කේ.එම්.ජී.සමරසේන මහතා විසින් සිදු කරන ලදි. සංවර්ධන නිලධාරී නිවර්තනා විතානගේ මහත්මිය හා සංවර්ධන නිලධාරී මල්ෂානි ආනන්ද මෙනවිය විසින් සම්බන්ධිකරණය සිදු කරන ලදී.









## අස්වැසුම සුභසාධන ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීම සඳහා කාර්යබද්ධ පුහුණුවේ සහතික පත්‍ර බෙදාදීම

### ඉංගිරියට.............

ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අස්වැසුම ප්‍රතිලාභී පවුල් සවිබලගැන්වීම සඳහා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් ලබා දුන් කාර්යබද්ධ පුහුණුවට සම්බන්ධ වු සංවර්ධන නිලධාරීන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා සහතික පත්‍ර බෙදා දිම 2024.10.11 දින ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත් විය. එම අවස්ථාව සඳහා පුහුණු හා පර්යේෂණ නිලධාරී සුනන්ද සිරිසේන මහතා සහ පුහුණු හා පර්යේෂණ නිලධාරී මංගලිකා වනසුන්දර මහත්මිය ද සහභාගී වන ලදි.





## තරුණ ප්‍රජාව සවිබලගැන්වීම සඳහා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන පුහුණුව

### කොළඹට.............

කොළඹ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ තරුණ ප්‍රජාව ව්‍යවසායකත්වය හා නායකත්වය තුළින් සවිබලගැන්වීමේ පුහුණු වැඩසටහන 2024.10.22 දින කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්විණ.





## අස්වැසුම දිළිඳු පවුල් සවිබලගැන්වීම උදෙසා .......

**කැළණිය.............**

කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සමෘද්ධි සංවර්ධන නිලධාරින් උදෙසා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් පුහුණු වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. එම පුහුණු වැඩසටහන් සඳහා සම්බන්ධ වූ සමෘද්ධි නිලධාරින් උදෙසා සහතික පත්‍ර ප්‍රධානය 2024.10.29 දින කැළණිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේදී පැවැත්විණි.





**කාර්යක්ෂම පරිගණක භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුවක්...**

2024.12.12 වන දින පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී රාජ්‍ය සේවය උදෙසා කාර්යක්ෂම පරිගණක භාවිතය පිළිබඳ කාර්යය මණ්ඩලය වෙනුවෙන් එක්දින පුහුණු වැඩමුළුවක් පවත්වන ලදි. මේ සඳහා සම්පත් දායකත්වය වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී නීල් ප්‍රියමාල් හේරත් මහතා විසින් ලබා දෙන ලදි.





# අස්වැසුම සුභසාධන ප්‍රතිලාභී පවුල් සවිබලගැන්විම - ව්‍යවසායකත්ව සංවර්ධන මගගැන්විමේ පුහුණුව

## උඩුනුවරට.............

2024.11.05 හා 06 යන දෙදින හා 2024.11.28 හා 29 දෙදින ද උඩුනුවර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් සමෘද්ධි ප්‍රතිලාභින් උදෙසා ව්‍යවසායකත්ව මගගැන්විමේ පුහුණු වැඩසටහන උඩුනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදි පවත්වන ලදී. මේ සඳහා සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂණ නිලධාරි කේ.එම්.ජී.සමරසේන මහතා සහ පුහුණු හා පර්යේෂණ නිලධාරී දිනුෂා අල්ගම මහත්මිය විසින් සිදු කරන ලදී. සංවර්ධන නිලධාරී මල්ෂානි ආනන්ද මෙනවිය විසින් පුහුණුව සම්බන්ධිකරණය සිදු කරන ලදී.

## අරණායකට.............

අරණායක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් සමෘද්ධි ප්‍රතිලාභින් උදෙසා ව්‍යවසායකත්ව සංවර්ධන මඟගැන්විමේ පුහුණුව 2024.11.25 හා 26 යන දෙදින අරණායක ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි. සංවර්ධන නිලධාරී ප්‍රදිප් ලංකාපෙළ මහතා සහ සංවර්ධන නිලධාරී නිරෝෂා විජේවර්ධන මහත්මිය විසින් පුහුණුව සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී. සම්බන්ධිකරණ කටයුතු සංවර්ධන නිලධාරී පසන්සක් වැත්තැව මහතා විසින් සිදු කරන ලදී.









**රත්තොටට.............**

රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සමෘද්ධි ප්‍රතිලාභීන් උදෙසා පැවති ව්‍යවසායකත්ව සංවර්ධන මගගැන්වීමේ පුහුණු වැඩසටහන 2024.12.13 වන දින රත්තොට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. මේ සඳහා සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂණ නිලධාරී එස්.එම්.යූ.බී.සමරකෝන් මහතා සහ සංවර්ධන  නිලධාරී ආනන්ද ප්‍රේමසිරි මහතා විසින් ලබා දුන් අතර සම්බන්ධිකරණය සංවර්ධන නිලධාරී ගයනී නවරත්න මහත්මිය විසින් සිදු කරන ලදි.









## ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන පුහුණුව අරණායකට ...........................

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ මෙහෙයවීමෙන් ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන 2024.10.21 හා 22, 23 යන තෙදින ආරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ආර්ථික සංවර්ධන නිලධාරින් 35 දෙනකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලද මෙම පුහුණුව සඳහා සම්පත් දායකත්වය සංවර්ධන නිලධාරී කපිල ධර්මප්‍රිය මහතා සහ සංවර්ධන නිලධාරී සුභානි පියසිංහ මහත්මිය විසින් ලබා දෙන ලදී. සම්බන්ධිකරණය සංවර්ධන නිලධාරී ගයානී නවරත්න මහත්මිය විසින් ලබා දෙන ලදී.

2024.12.09, 10 හා 11 යන තෙදින අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ආර්ථික සංවර්ධන නිලධාරින් උදෙසා පැවති මෙම පුහුණුව සඳහා සම්පත් දායකත්වය පුහුණු නිලධාරී කපිල ධර්මප්‍රිය මහතා සහ පුහුණු නිලධාරී සුභානි පියසිංහ මහත්මිය විසින් ලබා දෙන ලදී.









## තුන්වන කාර්තුවට අදාළ ප්‍රගති සමාලෝචනය .............

තුන්වන කාර්තුවට අදාළ ප්‍රගතිය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා අංශ ප්‍රධාන රැස්වීම අතිරේක ලේකම් හේමා පෙරේරා මහත්මියගේ ප්‍රධානත්වයෙන් 2024.10.15 වන දින අමාත්‍යාංශයේදී පවත් වන ලදී.





## විපර්යකාරක අදියරගත පුහුණුව .............

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට විශේෂිත වූ විපර්යකාරක අදියරගත පුහුණුව 2024 වර්ෂයේ බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේදි ආරම්භ විය. විපර්යකාරක අදියරගත පුහුණුවේ දෙවන අදියර 2024.10.08, 09 හා 10 දින ද, තුන්වන අදියර 2024.11.20, 21 හා 22 දින ද, 2024.12.16, 17 හා 18 දින පුහුණුවේ හතරවන අදියර ද පවත්වන ලදී. මෙහිදි පුහුණුලාභීන් 16 දෙනෙකු මෙම පුහුණුව නිමා කර ආයතනයේ පුහුණු සංචිතයට ඇතුළත් කරන ලදි. මේ සඳහා සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂණ නිලධාරී සුනන්ද සිරිසේන මහතා ද, පුහුණු හා පර්යේෂණ නිලධාරී නිහාල් වීරසූරිය මහතා ද, පුහුණු හා පර්යේෂණ නිලධාරී චම්පා අල්විස් මහත්මිය හා පුහුණු හා පර්යේෂණ නිලධාරී මංගලිකා වනසුන්දර මහත්මිය ද ලබා දෙන ලදී. 2024.12.18 දින සහතික පත්‍ර ප්‍රධානය ද සිදු කරන ලදී.





## ප්‍රජා සහභාගිත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණ පුහුණුව ......

**මාවතගම හා ගඟවටකෝරළයට.............**

2024.11.04, 05 හා 06 යන තෙදින ප්‍රජා සහභාගිත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණ පුහුණුව පිළිමතලාව ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදි. මේ සඳහා ප්‍රතිලාභීන් ලෙස මාවතගම හා ගඟවටකොරළයට අයත් සංවර්ධන නිලධාරින් සම්බන්ධ වු අතර සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂණ නිලධාරී එස්.එම්.යූ.බී.සමරකෝන් මහතා සහ සංවර්ධන නිලධාරී ප්‍රදිප් ලංකාපෙළ මහතා විසින් සිදු කළ අතර සම්බන්ධිකරණය නිවර්තනා විතානගේ මහත්මිය විසින් සිදු කරන ලදි.









## පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා වැඩමුළුවක් ............

මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය, සෞභාග්‍යා සංවර්ධන කාර්යාලය, පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තුමේන්තුව, වැඩිහිටි මහ ලේකම් කාර්යාලය, අබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය යන ආයතනවලට අයත් කොළඹ, කළුතර, ගම්පහ යන දිස්ත්‍රික්කයන්හි ක්ෂේත්‍ර නිලධාරින් සඳහා පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමේ වැඩමුළුවක් 2024.11.07 දින ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදී. එම ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීමේදී වැඩසටහනේ අභිවෘද්ධිය සඳහා නිලධාරින්ට අවශ්‍ය වන පුහුණු වැඩසටහන් මොනවාදැයි හඳුනාගැනීම මෙහිදී සිදු විය. මේ සඳහා සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂණ නිලධාරී සුනන්ද සිරිසේන මහතා, පුහුණු හා පර්යේෂණ නිලධාරී නිහාල් වීරසූරිය මහතා, පුහුණු හා පර්යේෂණ නිලධාරී මංගලිකා වනසුන්දර මහත්මිය හා පුහුණු හා පර්යේෂණ නිලධාරී චම්පා අල්විස් මහත්මිය විසින් ලබා දෙන ලදී.









## සහභාගිත්ව නායකත්ව කුසලතා සංවර්ධන පුහුණුව කොත්මලේට හා පාතදුම්බරට .............

2024.11.20, 21 හා 22 දින සහභාගිත්ව නායකත්ව කුසලතා සංවර්ධන පුහුණුව පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී පැවිත්විණි. මේ සඳහා කොත්මලේ හා පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුයුක්ත නිලධාරින් සම්බන්ධ විය. මෙහි සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂණ නිලධාරී දිනුෂා අල්ගම මහත්මිය හා සංවර්ධන නිලධාරී ආනන්ද ප්‍රේමසිරි මහතා විසින් සිදු කළ අතර පුහුණුව සම්බන්ධිකරණය කළේ සංවර්ධන නිලධාරී ප්‍රියානි දයාරත්න මහත්මිය විසිනි.









## ආයතනයේ 50 වන සංවත්සරය නිමිත්තෙන් ....................

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට වසර 50ක් පිරිම නිමිත්තෙන් 2024.12.17 වන දින විද්වත් දේශනයක් ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. රුහුණු විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ හිටපු පීඨාධිපති මහාචාර්යය පී.ලියනආරච්චි මහතා ‘ග්‍රාමීය සංවර්ධනය සඳහා ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන සැලසුම්කරණය’ මැයින් විද්වත් දේශනයක් ඉදිරිපත් කරන ලදි. ආයතනයේ 50 වන සංවත්සරයට සමගාමීව ග්‍රාම සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රීය ප්‍රකාශනයක් ද එළි දක්වන ලදී. මෙම වැඩසටහන අමාත්‍යාංශ ලේකම් මලර්මදී ගංගාදරන් මහත්මියගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.











## ආයතනයෙන් ඔබට

- **සමාජ සජීවීකරණය**
- **ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය**
- **ප්‍රජා සහභාගිත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය**
- **ගෘහ කළමණාකරණය හා පවුල් සංවර්ධනය**
- **සහභාගිත්ව නායකත්ව කුසලතා සංවර්ධනය**
- **ප්‍රජාමූල සංවිධාන කළමනාකරණය**
- **පුහුණු වැඩසටහන් සැලසුම්කරණය හා කළමනාකරණය**
- **විපර්යකාරක පුහුණුකරු පුහුණුව**

මෙම පුහුණු පාඨමාලා සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සියළුම නිලධාරින් හට ඉල්ලුම් කිරිමේ හැකියාව ඇත. පුහුණු අවසානයේ ඉහළ දැනුමක් හා පිළිගත් සහතිකයක් පිරිනැමේ. ඔබ ආයතනයේ පුහුණු සඳහා දේශනශාලා, නේවාසිකාගාර පහසුකම්, භෝජනාගාර පහසුකම් අවශ්‍යනම් අදම අප ආයතනය අමතන්න

**බොරැල්ල - 0112695579**

**පිළිමතලාව - 0812579929**

## තරණයේ දායකත්වය

**උපදේශකත්වය**

තිළිණි සුරංගිකා කරස්නාගොඩ
අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

එම්.එස්.එස්. නස්ලි
නියෝජ්‍ය අධ්‍යක්ෂ
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**විද්‍යුත් මාධ්‍යගත කරණය**

චිත්‍රා ජයසිංහ
පුහුණු හා පර්යේෂණ නිලධාරි
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**සංස්කාරක**

එච්.එම්.ජී.කේ.නවරත්න
සංවර්ධන නිලධාරී
ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය